# ප්‍රධාන කරුණු ඇතුළත් ලේඛනය - මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

Merchant Bank of Sri Lanka & Finance PLC
MBSL

**ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සහ ෆිනෑන්ස් පීඑල්සී විසින් පිරිනමනු ලබන ස්ථාවර තැන්පතු නිෂ්පාදන සහ සේවාවන්හි ප්‍රධාන කරුණු ලේඛනය සමන්විත වේ.**

| නිෂ්පාදන / සේවා | අවශ්‍ය ලේඛන | සුදුසුකම් නිර්ණායක | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | **පුද්ගලික/ බද්ධ / ජ්‍යෙෂ්ඨ පුරවැසි**<br>- නිසි පරිදි සම්පූර්ණ කරන ලද MBSL ස්ථාවර තැන්පතු අයදුම්පත (Mandate).<br>- හඳුනාගැනීමේ ලේඛනය (ජාතික හැඳුනුම්පත) සහ ජාතික හැඳුනුම්පත නොමැති අවස්ථාවල දී, ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.<br>- පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ ලිපිනයට වඩා වෙනස් වන්නේ නම්, ලිපිනය තහවුරු කිරීම සඳහා වන සාක්ෂි ලේඛන (මාස 3ක් ඇතුළත නිකුත් කරන ලද ඒවා විය යුතුය).<br>- 'පාරිභෝගිකයා හඳුනාගැනීමේ' (KYC) අවශ්‍යතාවය | ශ්‍රී ලංකාවේ පුරවැසියන් / පදිංචිකරුවන් / ද්විත්ව පුරවැසියන් වන සහ වයස අවුරුදු 18 ට වැඩි පුද්ගලයන් වීම | - සියලුම පාරිභෝගිකයින්ට ප්‍රධාන කාර්යාලයට හෝ ආසන්නතම ශාඛාව වෙත පැමිණ තමන්ගේ අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කිරීමට ඇරයුම් කරනු ලැබේ. එම සාකච්ඡාවෙන් පසු, පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය අනුව සමාගම විසින් ඇගයීමක් සිදු කර අදාළ ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.<br>- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අනෙකුත් පුරවැසියන් යන දෙපාර්ශවයටම ආකර්ෂණීය පොළී අනුපාත පිරිනැමේ. පොලිය මාසිකව හෝ කල් පිරෙන විට ගෙවනු ලැබේ.<br>- එකඟ වූ කාල සීමාව සඳහා පොලී අනුපාත ස්ථාවරව පවතී.<br>- මාස 01 සිට මාස 60 දක්වා කාල සීමාවන් සඳහා තැන්පතු තැන්පත් කළ හැකිය.<br>- අවම තැන්පතු මුදල:<br>  • කල් පිරෙන විට පොලිය ගෙවන තැන්පතු සඳහා - රු. 5,000.00<br>  • මාසිකව පොලිය ගෙවන තැන්පතු සඳහා - රු. 10,000.00<br>- ජ්‍යෙෂ්ඨ පුරවැසි බද්ධ ගිණුම් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී අනුපාත ලබා ගැනීමට නම්, සියලුම ගිණුම් හිමියන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විය යුතුය.<br>- මාසික පොලී ගෙවීමේ දී, පොලිය ගණනය කරනු ලබන්නේ එකඟ වූ වාර්ෂික පොලී අනුපාතය වසරේ දින ගණනින් 365 බෙදා, එය අදාළ මාසයේ දින ගණනින් ගුණ කිරීමෙනි.<br>- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) විසින් පනවා ඇති රෙගුලාසිවලට අනුකූලව සමාගම ඉල්ලා සිටින තොරතුරු පාරිභෝගිකයා ලබා නොදෙන්නේ නම්, ඕනෑම තැන්පතුවක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට MBSL ආයතනයට අයිතිය ඇත.<br>- කල් පිරෙන විට පොලිය ගෙවන තැන්පතු සඳහා එහි වටිනාකමෙන් උපරිම 80%ක් දක්වා ද, මාසිකව පොලිය ගෙවන තැන්පතු සඳහා උපරිම 75%ක් දක්වා ද ක්ෂණික ණයක් ලබා ගත හැකිය (මාසික තැන්පතු කාල සීමාව අනුව ලබා ගත හැකි උපරිම ණය මුදල වෙනස් විය හැක).<br>- තැන්පතු රක්ෂණ ආවරණය තැන්පත් කර ඇති මුදල මත පදනම්ව, එක් තැන්පත්කරුවෙකු සඳහා උපරිම රු. 1,100,000.00 ක සීමාවක් දක්වා අදාළ වේ.<br>- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි, කාලය ඉකුත්වීමට පෙර ලබාගන්නා තැන්පතු සඳහා අඩු පොලී අනුපාතයක් අදාළ වේ. (මාසයකට අඩු කාලසීමාවක් සඳහා පොලී ගෙවනු නොලැබේ). |
| | **සමාගම්/ හවුල් ව්‍යාපාර/ ඒක පුද්ගල ව්‍යාපාර/ සමාජ සහ සමිති/ භාර**<br>- නිසි පරිදි සම්පූර්ණ කරන ලද MBSL ස්ථාවර තැන්පතු අයදුම්පත (Mandate).<br>- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය / සංස්ථාගත කිරීමේ සහතිකය<br>- සමාගම් ව්‍යවස්ථාව<br>- අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව<br>- අධ්‍යක්ෂ මණ්ඩල ලේඛනය (ආකෘති පත්‍ර - 01) සහ අධ්‍යක්ෂවරුන්ගේ යම් වෙනස්වීම් (ආකෘති පත්‍ර - 20).<br>- පවතින සමාගමක් ලෙස නැවත ලියාපදිංචි වී ඇත්නම් (ආකෘති පත්‍ර - 40).<br>- සංගමයේ / සමාජයේ හෝ සමිතියේ ව්‍යවස්ථාව සහ රැස්වීම් වාර්තා.<br>- බලයලත් අත්සන්කරුවන් අනුමත කිරීම සඳහා වූ සහතික කරන ලද ලේඛන.<br>- බලයලත් අත්සන්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරන ලේඛන.<br>- ලිපිනය තහවුරු කිරීම සඳහා වූ ලේඛන සාක්ෂි (සමාගම් නාමයෙන් පවතින උපයෝගිතා බිල්පතක් හෝ බැංකු ගිණුම් වාර්තාවක්). | ව්‍යාපාර නාම ආඥා පනතට අනුව ශ්‍රී ලංකාවේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සංස්ථාපිත ආයතන සහ අනෙකුත් ව්‍යාපාරික ආයතන / ආයතන. | |

**මෙම ලේඛනය, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.**

| | | | |
|---|---|---|---|
| | • ආයතනික පාරිභෝගික හඳුනාගැනීමේ (KYC) අවශ්‍යතාවය.<br>• ප්‍රතිලාභී අයිතිය (UBO) පිළිබඳ ප්‍රකාශය.<br>• බලයලත් අත්සන්කරුවන්ගේ පාරිභෝගික හඳුනාගැනීමේ (KYC) තොරතුරු.<br>• අත්සන් කාඩ්පත. | | • ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.<br>• බදු හෝ විගණන කටයුතු සම්බන්ධ ශේෂය තහවුරු කිරීමේ සහතික සඳහා ගාස්තු අය නොකරන අතර වීසා අවශ්‍යතා සඳහා තානාපති කාර්යාල වෙත ඉදිරිපත් කරන ශේෂය තහවුරු කිරීමේ ලිපි සහ ගිණුම් වාර්තා ලබාගැනීම සඳහා රු. 1,000.00 ක සේවා ගාස්තුවක් අය කෙරේ.<br>• ස්ථාවර තැන්පතුවක් ඇපයට තබා ලබාගන්නා ණය සඳහා අදාළ වන පොලී අනුපාතය, තැන්පතුව සඳහා එකඟ වූ පොලී අනුපාතයට වඩා 3.50% ක් වැඩි වන අතර, ඒ සඳහා රුපියල් 1,000.00 ක සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.<br>• ස්ථාවර තැන්පතු සහතිකය නැතිවුවහොත් හෝ හානි වුවහොත්, එහි දෙවන පිටපතක් ලබා ගැනීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් සහ MBSL ෆිනෑන්ස් ආයතනයේ සමාගමේ වන්දි ගෙවීමේ පොරොන්දු පත්‍රය (Indemnity) ඉදිරිපත් කළ යුතුය.<br>• දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියමය පරිදි රඳවා ගැනීමේ බදු (WHT) අදාළ වේ<br>• කල් පිරීමේ නිවේදන පාරිභෝගිකයා වෙත එවනු ලැබේ.<br>• නාමනකරු පහසුකම (Nominee) (අවශ්‍ය නම් පමණක්).<br>• කල් පිරුණු තැන්පතු, මුල් ස්ථාවර තැන්පතු සහතිකය සමඟ කල් පිරීමට පෙර ලබා දී ඇති උපදෙස් අනුව වසා දමනු ලැබේ.<br>• තැන්පතුව සහතිකයේ සඳහන් කාල සීමාව සඳහා ස්ථාවර වන අතර එය නියමිත කාලයට පෙර වසා දැමිය නොහැක. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) උපදෙස් වලට යටත්ව, සාමාන්‍ය ඉතිරි කිරීමේ පොලී අනුපාතයට වඩා 2.00% ක වැඩිපුර අගයක් අඩු කිරීමේ පදනම මත කළමනාකාරිත්වයේ අභිමතය පරිදි කාලය ඉකුත්වීමට පෙර මුදල් ලබා ගැනීම සලකා බැලිය හැකිය.<br>• ඒකාබද්ධ ගිණුම් සඳහා, තැන්පතුව නියමිත කාලයට පෙර ලබා ගන්නේ නම් සියලුම පාර්ශවයන්ගේ එකගතාව ලබා දිය යුතුය.<br>• ස්ථාවර තැන්පතුවක් කාලය ඉකුත්වීමට පෙර වසා දැමීමේ දී ගෙවන පොලී අනුපාතය තැන්පතු කාල සීමාව හෝ ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ මත තීරණය වේ. මාසිකව පොලී ලබාගෙන ඇත්නම්, වැඩිපුර ගෙවන ලද පොලී මුදල මුල් ප්‍රාග්ධනයෙන් අය කර ගනු ලැබේ.<br>• තැන්පතුකරු විසින් මුදල් ආපසු ගැනීම පිළිබඳ කිසිදු උපදෙසක් ලබා දී නොමැති නම්, පවතින පොලී අනුපාතය යටතේ නැවත ස්වයංක්‍රීයව අලුත් කෙරේ. |

# ප්‍රධාන කරුණු ඇතුළත් ලේඛනය - මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

Merchant Bank of Sri Lanka & Finance PLC

## ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී වෙතින් නිෂ්පාදන සහ සේවාවන් ලබා ගැනීමේ ක්‍රියාවලිය

- MBSL ආයතනයෙන් නිෂ්පාදන / සේවාවන් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයින්ට තමන්ට ආසන්නතම ශාඛාව වෙත පැමිණීමට හෝ සම්බන්ධ වීමට හැකිය. ශාඛා පිහිටි ස්ථාන සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක අපගේ www.mbslbank.com වෙබ් අඩවියේ දක්වා ඇත.
- පාරිභෝගිකයා විසින් අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර, අදාළ ඉල්ලීම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නිෂ්පාදනයට / සේවාවට අදාළ සියලුම ලියකියවිලි ශාඛා නිලධාරියා වෙත භාර දිය යුතුය. පාරිභෝගිකයා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු නිවැරදි විය යුතුය.

## ඒකාබද්ධ ස්ථාවර තැන්පතු

- ඒකාබද්ධ තැන්පතුවක එක් තැන්පත්කරුවෙකුගේ අභාවය සිදුවූ අවස්ථාවකදී, ඒ බව වහාම MBSL ආයතනය වෙත දැනුම් දිය යුතු අතර, එම තැන්පතුව සම්බන්ධයෙන් උනන්දුවක් හෝ අයිතියක් ඇති එකම පුද්ගලයා ලෙස MBSL ආයතනය විසින් පිළිගනු ලබන්නේ ජීවත්ව සිටින අනෙක් තැන්පත්කරු (Survivor) පමණි.

## පොලී අනුපාත

- නියාමන ආයතනය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්ට අනුව, පොලී අනුපාත MBSL ආයතනය විසින් තීරණය කරනු ලැබේ.
- වෙළඳපොළ තත්වයන් සහ නියාමන මාර්ගෝපදේශ මත පදනම්ව කලින් කලට පොලී අනුපාත සංශෝධනය කරනු ඇත.
- තැන්පතු නිෂ්පාදන සඳහා අදාළ වන වත්මන් පොලී අනුපාත අපගේ සියලුම ශාඛාවල ප්‍රදර්ශනය කර ඇති අතර www.mbslbank.com යන අපගේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.

## මියගිය ගනුදෙනුකරුවන්ගේ අරමුදල් නම්කළ තැනැත්තා / නීත්‍යානුකූල උරුමක්කාරයන් වෙත නිදහස් කිරීම

- මියගිය ගනුදෙනුකරුවන්ගේ ගිණුම් සඳහා සම්මත නීතිමය ක්‍රියාපටිපාටිය අනුගමනය කරනු ලැබේ (නම් කළ තැනැත්තා / ප්‍රතිලාභීන් / නීත්‍යානුකූල උරුමක්කාරයන් ඒ සඳහා හිමිකම් ලබනු ඇත).
- ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි:
  - ස්ථාවර තැන්පතුවක් නම්: මුල් ස්ථාවර තැන්පතු සහතිකය / මුල් මරණ සහතිකය / නම් කළ තැනැත්තාගෙන් ලැබෙන ඉල්ලීම් ලිපිය / නම් කළ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත / නම් කළ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශය / නම් කළ තැනැත්තාගේ KYC ගනුදෙනුකරු හඳුනා ගැනීමේ) ප්‍රකාශනය.

## නිෂ්පාදන සහ සේවා සම්බන්ධයෙන් බලපැවැත්වෙන නෛතික විධිවිධාන

- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත.
- 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝග සහ චක්‍රලේඛ.
- සිවිල් නඩු විධාන සංග්‍රහය සහ ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන අනෙකුත් අදාළ නීති.

**මෙම ලේඛනය, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.**

## අක්‍රිය ගිණුම් / අතහැර දැමූ දේපළ

- අතහැර දැමූ තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව CBSL විසින් ලබා දී ඇති සම්මත නීතිමය ක්‍රියාපටිපාටිය අනුගමනය කරනු ඇත. 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතට අනුව, උපරිම වසර 10 ක් දක්වා කිසිදු ගනුදෙනුවක් හෝ සන්නිවේදනයක් සිදු නොවූ තැන්පතු, අක්‍රිය තැන්පතු ලෙස සලකුණු කර පසුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ලැබේ.

## අනාවරණය කිරීම

- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 61(2) වගන්තියේ විධිවිධානවලට යටත්ව, පාරිභෝගිකයා සමඟ සිදු කරනු ලබන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් MBSL ආයතනය දැඩි රහස්‍යභාවයක් පවත්වාගෙන යනු ලබයි.
- MBSL ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් වන අතර, පාරිභෝගිකයා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව සහ පාරිභෝගිකයා වෙත තවදුරටත් බැඳීමකින් හෝ නීතිමය ක්‍රියාමාර්ගයකින් තොරව, පාරිභෝගික ගනුදෙනුවල විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහ අනෙකුත් නියාමන හෝ ව්‍යවස්ථාපිත ආයතන වෙත ලබා දීමට බැඳී සිටී.

## 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

- යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනුවක් කිරීමට දරන උත්සාහයක්, කිසියම් නීති විරෝධී ක්‍රියාවකට හෝ අපරාධමය වරදකට සම්බන්ධ බවට සැක කිරීමට MBSL ආයතනයට සාධාරණ හේතු තිබේ නම්, 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ MBSL විසින් එම ගනුදෙනුව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලබයි.
- සැකකටයුතු ගනුදෙනු සහ නියමිත සීමාව ඉක්මවූ (රුපියල් මිලියන 1 ට වැඩි) ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) වෙත වාර්තා කරනු ලැබේ.

Merchant Bank of Sri Lanka & Finance PLC

## පාරිභෝගික පැමිණිලි විසඳීමේ ක්‍රියා පටිපාටිය

- පාරිභෝගිකයන් හට පහත සඳහන් ඕනෑම ක්‍රමයක් මගින් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා (MBSL) වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.
  - සෑම ශාඛාවකම අදාළ ශාඛා කළමනාකරු හෝ දෙවන නිලධාරියා ඇමතීම හෝ ඔවුන් වෙත ලිඛිතව දැනුම් දීම මගින්.
  - අපගේ ක්ෂණික ඇමතුම් අංකය වන 0114 711 711 ඇමතීම මගින්.
  - පාරිභෝගික සේවා අංශය වෙත විද්‍යුත් ලිපියක් (E-mail) යොමු කිරීම මගින්: customercare@mbslbank.com
  - MBSL හි පැමිණිලි මෙහෙයවීමේ නිලධාරී සම්බන්ධ කර ගැනීම හෝ ඔහු වෙත ලිඛිතව දැනුම් දීම මගින්.
    **(රුවන් පියදාස මයා (වැඩ බලන) , 14 වන මහල, ලංකා බැංකු මර්චන්ට් කුළුණ, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03. ජංගම දුරකථන අංකය: 077 321 9578).**

- වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර ප්‍රසිද්ධ කර ඇති පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියා පටිපාටිය පරිශීලනය කරන්න.

- සතුටුදායක විසඳුමක් ලබා නොදෙන අවස්ථාවක දී, පාරිභෝගිකයාට තම පැමිණිල්ල ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත යොමු කළ හැකිය.

  **මූල්‍ය ඔම්බුඩ්ස්මන්, මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය, අංක 143, වජිර පාර, කොළඹ 05.**
  දුරකථන අංකය: +94 11 259 5624 සන්නිවේදන ෆැක්ස් (Telefax): +94 11 259 5625 විද්‍යුත් තැපැල: fosril@sltnet.lk වෙබ් අඩවිය: www.financialombudsman.lk